中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# සූභාසර්

2018 - දෙවන කලාපය

# 蓮花

沈鹏



中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

# සුභාෂර 蓮花

## චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය


**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2374/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ශී යුයැ, හාඕ ලී ෆාං, වං යිං

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෙං ලී, ලියු හුයි,
හාඕ ලී ෆාං, චාං යෝ යෝ, වං යිං,
චෙන් ගුවැන් වන්, සුන් ජියෑන් චාඕ,
රවිමල් හඳුවල, සුගත් රත්නායක,
නිසංසලා රත්නායක

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


# පටුන


ශංහයි සහයෝගිතා සංවිධානයේ
චින්ග් දාඕ නායක සමුළුව සාර්ථකත්වයක් 02

චීනයේ ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ
ප්‍රතිපත්තියෙන් මැවෙන ශෙන් චෙන් ආශ්චර්ය 08

චීනයේ ක්‍රිස්ටල් නගරය 11

නිෂ්පාදන කර්මාන්ත වර්ධනයේදී අවධානයට
ලක් කළ යුතු අවස්ථා කිහිපයක් හඳුනා ගනිමු 14

කුඩා ධීවර ගම්මානයකින් ඇරඹි වත්මන්
ශෙන් චෙන් හි සංවර්ධනය 17

චීන ගායක ලි චියෑන් 20

සතුට ඇති තැන බොහෝ මිතුරන් හමු වේ 26

විස්මිත චීන මහා ප්‍රාකාරය 28

බිත්තර සහිත බැදපු තක්කාලි 31

විදිනෙදා චීන බස 32

අසන්නන්ගේ බිත්ති පුවරුව 34

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් 36

# ශංහයි සහයෝගිතා සංවිධානයේ

# චින්ග් දාඕ නායක සමුළුව

# සාර්ථකත්වයක්

ශංහයි සහයෝගිතා සංවිධානයේ සාමාජික රටවල නායක පාලක මණ්ඩලයේ 18 වැනි සමුළුව ජූනි මස 10 වැනිදා ශැන් තුං පලාතේ චින්ග් දාඕ නගරයේ පැවැත්විණ. චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ශංහයි ජීවගුණය ප්‍රවර්ධනය කරමින් පොදු ඉරණමක් සහිත ප්‍රජාව බිහි කරමු මැයෙන් ප්‍රධාන දේශනය එහිදී සිදු කළේය.

ශංහයි සහයෝගිතා සංවිධානය ස්ථාපිත වී වසර 17තුළ දැවැන්ත ප්‍රගතියක් ලබා ගෙන ඇතැයි චීන ජනාධිපති ෂී ජින් පිං මහතා සඳහන් කරයි. වර්තමානයේ ශංහයි සහයෝගිතා සංවිධානය ලෝකයේ විශාලත ම භූමි ප්‍රමාණය හා වැඩි ම ජනගහණය සම්බන්ධ සංයුක්ති කලාපීය සහයෝගිතා සංවිධානය බව හෙතෙම අවධාරණය කළේය. එහි සාමාජික රටවල ආර්ථික හා ජනගහණය ලෝකයේ සියයට 20ක හා සියයට 40ක කොටසකට අයත්වෙයි. ශංහයි සහයෝගිතා සංවිධානය, සාමාජික රවටල් අටකින්, නිරීක්ෂණ රටවල් හතරකින්, සංවාද හවුල්කාරී රටවල් හයකින් ද සමන්විත වන අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමඟ පුළුල් සහයෝගතා සබඳතා පවත්වා ගෙන යමින් සිටී.

ශංහයි සහයෝගිතා සංවිධානය, නොබැඳි, අවිහිංසාවාදී, තෙවන පාර්ශ්වයකට එරෙහිව ප්‍රහාර එල්ල නොකිරීමේ සංවර්ධනාත්මක හවුල්කාරී සබඳතාවක් බිහි කර තිබේ. එය ජාත්‍යන්තර සබඳතා න්‍යාය හා භාවිතය පිළිබඳ වැදගත් නිර්මාණයක් බව හෙතෙම පැවසීය. කලාපීය සහයෝගීතාව පිළිබඳ නව ක්‍රමයක් ඇති කර කලාපීය සාමය හා සංවර්ධනය වෙනුවෙන් නව කැපවීමක් සිදු කර ඇතැයි ද ෂී ජින් පිං මහතා ප්‍රකාශ කළේය.

වත්මන් ලෝකයේ අධිපතිවාදය හා බලදේශපාලනය තිබුනද ජාත්‍යන්තර පටිපාටිය පෙරට වඩා වැඩි සාධාරණ දිශාව වෙත ඉදිරියට ගෙන යාම අත්හැර දැමිය නොහැකි බව ෂී ජින් පිං මහතා එහිදී අවධාරණය කළේය. ජාත්‍යන්තර සබඳතා ප්‍රජාතන්ත්‍රවාදීකරණය බාධා කළ නොහැකි යුගයේ ලක්ෂණයක් බවට පත් ව ඇති බව ද හෙතෙම සඳහන් කළේය. සාමය ආරක්ෂා කිරීමේ ශක්තියෙන් සාමය විනාශ කිරීමේ බලවේගයන් පරාජය කර සුරක්ෂිතතාව හා ස්ථාවරත්වය පවත්වා ගැනීම මානවයන්ගේ කැමැත්ත බවත් හෙතෙම පැහැදිලි කළේය. සහයෝගතා හා පොදු ජයග්‍රහණය සහ විවිධ ශිෂ්ටාචාරත්මක හුවමාරු හා අන්‍යෝන්‍ය අවබෝධ කර ගැනීම විවිධ රටවල ජනතාවගේ පොදු අපේක්ෂාව යැයි ද චීන ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

නිර්මාණශීලි, සම්බන්ධීකරණ, හරිත, විවෘත හා පොදු භාවිත සංවර්ධන සංකල්පය, පොදු, සංයුක්ති, සහයෝගතා, තිරසර ආරක්ෂණ සංකල්පය, විවෘත, අන්තර්ගත, අන්‍යෝන්‍ය යහපත්, පොදු ජයග්‍රහණ සහයෝගතා සංකල්පය, සාධාරණ, අන්‍යෝන්‍ය



ඉදිරිපත් කිරීම : ෂී යුයැ












වෙනස්ව සැලකීම්, සංවාද, ඉවසීමේ ශිෂ්ටාචාර සංකල්පය සහ පොදු සාකච්ඡා පොදු සංවර්ධන පොදු භාවිත ගෝලීය පරිපාලන සංකල්පය යන සංකල්පයන්හි අප රැඳී සිටිය යුතු බව චීන ජනපති පැවසීය.

චින්ග් දාඕ නායක සමුළුව ශංහයි සහයෝගිතා සංවිධානයේ සාමාජික රටවල් සංඛ්‍යාව වැඩි වීමෙන් පසු සාමාජික රටවල් 8ක නායකයන් එක්ව පවත්වන ප්‍රථම නායක සමුළුව බැවින් ඊට ඓතිහාසික අර්ථයක් ඇති බව චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ප්‍රකාශ කළේය.

ශංහයි සහයෝගිතා සංවිධානය තවදුරටත් දියුණු වීමත් සමඟ ම එම සංවිධානය කලාපීය ආරක්ෂාව හා ස්ථාවරත්වය, සංවර්ධනය හා සමෘද්ධිය ඉදිරියට මෙහෙයැවීම යනාදී ක්ෂේත්‍රවල දැරිය යුතු වගකීම් ක්‍රමයෙන් වැඩි වී ඇතැයි ද හෙතෙම පෙන්වා දුන්නේය.විවිධ සාමාජික රටවල් සමඟ එක්ව මෙවර සමුළුව ප්‍රයෝජනයට ගෙන සංවර්ධන අත්දැකීම් සාරාංශ කොට ජාත්‍යන්තර හා කලාපීය තත්ත්වය විශ්ලේශනය කරමින් ඉදිරි සහයෝගතා දැක්ම සැලසුම් කිරීමට චීනය කැමති බව ෂී ජින් පිං මහතා පැහැදිලි කළේය.

චීනය සෙසු සාමාජික රවටල් සමඟ එක්ව, මීළඟ වාරික සභාපති රට වන කිර්ගිස්ථානයට අනුබල දෙමින් ශංහයි සහයෝගිතා සංවිධානයේ වඩාත් ආලෝකවත් අනාගතය වෙනුවෙන් අත්වැල් බැඳගෙන පෙනී සිටීමට අපේක්ෂා කරයි.









上海合作组织成员国元首理事会会议
ЗАСЕДАНИЕ СОВЕТА ГЛАВ ГОСУДАРСТВ-ЧЛЕНОВ
ШАНХАЙСКОЙ ОРГАНИЗАЦИИ СОТРУДНИЧЕСТВА
2018年6月9–10日 中国·青岛 9-10 ИЮНЯ 2018 Г. ЦИНДАО КИТАЙ




新华网
WWW.NEWS.CN

# චීනයේ ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ ප්‍රතිපත්තියෙන් මැවෙන

# ශෙන් චෙන් ආශ්චර්යය

ඉදිරිපත් කිරීම : ෂෙං ලී



2018 වසර චීනයේ සංවර්ධන ඉතිහාසයේ සුවිශේෂී කඩඉමකි. ඒ, චීනය ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ ප්‍රතිපත්තිය අනුගමනය කර දශක 4ක් පිරීම හේතුවෙනි. චීනයේ පාලක කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ වසර 40ක් පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වූ මෙම ප්‍රතිපත්තිය චීනය මෙතෙක් ලද දැවැන්ත සංවර්ධන ජයග්‍රහණ සඳහා වන තීරණාත්මක සාධකය යැයි පොදුවේ පිළිගැනේ.

ගෙවී ගිය වසර 40 තුළ චීනය ලබාගෙන ඇති එම ජයග්‍රහණ පිළිබඳ සලකා බැලීමේදී දකුණු චීනයේ ගුවං තුං පළාතේ ශෙන් චෙන් නගරය කැපී පෙනෙන උදාහරණයකි. මීට වසර 40කට පෙර ශෙන් චෙන්, කිසිදු ප්‍රසිද්ධියක් නොදැරූ උපනගරයක් විය. එහෙත් අද මෙම නගරය කෝටි 4ක පමණ ජනගහණයක් සිටින නවීන ජාත්‍යන්තර නගරයක් බවට පරිවර්තනය වී හමාර ය.

" චීනය ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමේදී මෙතෙක් ලද ආකර්ෂණීයම ජයග්‍රහණයක් වශයෙන් චීන සංවර්ධන ලක්ෂණයන්ගෙන් යුත් විශේෂ ආර්ථික කලාප සටහන් කළ හැකිය. ලෝකයේ විශේෂ ආර්ථික කලාප 4000කට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා. එහෙත් ඒ අතරින් ශෙන් චෙන් විශේෂ ආර්ථික කලාපය හා සැසඳිය හැකි කිසිවක් නැහැ. ගෙවී ගිය වසර 40 තුළ ශෙන් චෙන් නගරය විශේෂ ආර්ථික කලාප සංවර්ධනයෙන් ලබාගෙන ඇත්තේ ඉහළ ම මට්ටමේ ආශ්චර්යයක්." යනුවෙන් බ්‍රිතාන්‍යයේ 'ආර්ථික විශේෂඥයින්ගේ' සඟරාව විචාරක මතයක් පළ කර ඇත.

මෙම මතයට තුඩු දුන් බොහෝ කරුණු තිබේ. දින 3කින් ගොඩනැගිල්ලක් ඉදි කර අවසන් කිරීමේ "ශෙන් චෙන් වේගය "ලොව පුදුමයට හේතු වී තිබේ. ලොව 3වැනි විශාලතම බහලුම් මෙහෙයුම් වරාය, චීනයේ ප්‍රධාන ගුවන් සේවා මධ්‍යස්ථාන 5කින් එකක් සහ ලොව ප්‍රබල ව්‍යවසායන් පන්සියයෙන් 7ක මූලස්ථාන පිහිටා තිබෙන්නේ ශෙන් චෙන් නගරයේ ය. ශෙන් චෙන් නගර භූමියේ සෑම වර්ග කිලෝමීටරයක ජාතික මට්ටමේ අධි විද්‍යා තාක්ෂණ ව්‍යවසායන් 6ක් පමණ පිහිටා ඇත. දිනපතා නව සොයා ගැනීම් පිළිබඳ පේටන්ට් බලපත්‍ර 51ක් මෙම නගරයෙන් නිකුත් කෙරේ. නොබෙල් සම්මානලාභී ඒරියේ වොෂෙල් සහ බ්‍රයන් කොබිල්කා යන රසායන විද්‍යාඥයන්ගේ ප්‍රමුඛත්වයෙන් ශෙන් චෙන් නගරයේ පරීක්ෂණාගාර 5ක් ස්ථාපිත කර තිබේ. 2017 වසරේ ශෙන් චෙන් නගරයේ දළ දේශීය නිෂ්පාදිතය චීන යුවන් ට්‍රිලියන 2.24ක් දක්වා ඉහළ ගොස් බෙයිජිං සහ ශැංහයි යන නගර දෙකට පමණක් දෙවැනි විය. එහෙත් මෙම නගරයේ බලශක්ති ඇතුළු ස්වභාවික සම්පත් පරිභෝජනය චීනයේ සාමාන්‍ය පරිභෝජන මට්ටමෙන් තුනෙන් එකක් පමණි.











"ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය ශෙන් චෙන් නගරය සතුව ඇති අදෘශ්‍යමාන සම්පතක් සහ ප්‍රබලතම මෘදු ශක්තියයි. හරියට කාන්දමක් වගේයි. සිව්දෙසින් සියලු සම්පත් ඇද ගත්තා." කියා ශෙන් චෙන් නගර ඉතිහාසය පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ යං ලී ශුන් මහතා පවසයි. එවක චීන රාජ්‍ය නායක තෙං ශියාඕ පිං මහතා චීනයේ ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ ශ්‍රේෂ්ඨ සැලසුම්කරුවා වශයෙන් සැලකේ. එතුමාගේ ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ සංකල්පය අනුව පසුගිය 70 දශකය අවසානයේ චීන ලක්ෂණයන්ගෙන් යුත් විශේෂ ආර්ථික කලාප රැසක් බිහි විය. ඉන් එක් විශේෂ ආර්ථික කලාපයක් ශෙන් චෙන් නගරයේ ස්ථාපිත කෙරිණ. රටේ සෙසු ප්‍රදේශවලට වඩා වෙනස් හා විශේෂ ආර්ථික අනුග්‍රාහී ප්‍රතිපත්ති එම විශේෂ ආර්ථික කලාපය තුළ ක්‍රියාත්මක කළේ ය. ඒ සමගින් අධි තාක්ෂණ, කාර්යක්ෂම කළමනාකරණය, ඉහළ දැනුමෙන් යුත් වෘත්තිකයන් හා ප්‍රවීණයන් සහ නම්‍යශීලි වාණිජ හා ආයෝජන ප්‍රතිපත්ති යනාදිය එම විශේෂ ආර්ථික කලාපවල වෙළෙඳ පොල ආර්ථිකයට සරිලන අයුරින් සක්‍රීය කර තිබිණ.

ලොව මවිත කරවන ආර්ථික ජයග්‍රහණ අඛණ්ඩ ව අත්කරගෙන ඇති ශෙන් චෙන් විශේෂ ආර්ථික කලාපය, ගෙවී ගිය දශක හතරක කාලය පුරා චීනය අනුගමනය කළ ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය පිළිබඳ ප්‍රතිපත්තියේ සාර්ථක කැඩපතකි. චීන ජනාධිපති ෂී ජින් පිං මහතා කී පරිදි නව යුගයේ චීන ලක්ෂණයන්ගෙන් යුත් සමාජවාදී ක්‍රමය යටතේ මෙම ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක කෙරෙනු ඇත. නගර වැසියන්ගේ සාමාන්‍ය වයස අවුරුදු 32.5ක් පමණ වන ශෙන් චෙන් නගරය තාරුණ්‍යයෙන් හා නව ජවයෙන් යුතුව රටේ දීප්තිමත් අනාගතයට උර දී සිටිනු පෙනේ.





# චීනයේ ක්‍රිස්ටල් නගරය

වෙරළාසන්න තුං හයි කෝරළය චීනයේ ච්‍යං සූ පළාතේ ලියැන් යුන් ගාං නගරයේ පිහිටා තිබේ. විදේශයන්ට සිය සංචාර සඳහා චීනය පළමුව විවෘත කළ කෝරළ අතර එකක් වශයෙන් මෙය හැඳින්වේ. වසර 40කට පමණ පෙර එහි ග්‍රාමීය ආර්ථිකයේ මූලික ස්ථානයේ පැවතියේ කුඩා කෝරළයක් පමණයි. එහෙත් වසර 40කට පමණ පසුව එහි මල් වගාව, පළිඟු නිපදවීම සහ උණු දිය උල්පත් නිවාඩු නිකේතන යනාදී විශේෂ ලක්ෂණයන්ගෙන් සමන්විත කර්මාන්ත හිමි පදිංචියට සුදුසු වෛවිය නගරයක් තුං හයි කෝරළය බවට පත්ව තිබේ.



නැගෙනහිර චීනයේ මල් නගරය යන නමින් හැඳින්වෙන තුං හයි කෝරළයේ ප්‍රධාන වශයෙන් මානෙල්, තෘණ වගාව, පියෝනි මල් සහ අප්‍රිකානු කපුරු මල් වගා කෙරේ. වර්තමානයේ එහි මල් වගා කර ඇති සමස්ත බිම් ප්‍රමාණය හෙක්ටාර් 6600 ඉක්මවා තිබේ. එහි සමස්ත නිෂ්පාදන වටිනාකම යුවාන් කෝටි 150කි. ඉන් ප්‍රතිලාභී වැසියන්ගේ සංඛ්‍යාව ලක්ෂයකට අධිකය. චීනයේ ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය යන ප්‍රතිපත්තියට අනුව, එහි රජය ප්‍රාදේශීය ලක්ෂණවලින් හෙබි මල් ප්‍රදර්ශන විවිධ අවස්ථාවල සංවිධානය කර තිබේ. මෑතකදී 7 වැනි තුං හයි මල් ප්‍රදර්ශනය එහි සි ශුවාන් විල ආශ්‍රිත කලාපයෙදී පැවැත්විණ.

ඉදිරිපත් කිරීම : වාං යෝ යෝ





සිය වෙරළාසන්න පිහටීම නිවැරදිව ග්‍රහනය කරගත් තුං හයි කෝරළය මල් කර්මාන්තයේ අන්තර් ජාතික සහයෝගීතා සක්‍රීය ලෙස ප්‍රවර්ධනය කරමින් සිටී. ඕලන්දයෙන් මල් වර්ග ආනයනය කරනවා පමණක් නොව, එම කෝරළයේ මල් වර්ග ද විදේශ රටවලට හඳුන්වා දීම සිදු කෙරේ. ඒ සඳහා විදේශීය රටවල තානාපති කාර්යාල නිලධාරීන් හා විදේශීය ව්‍යවසායකයින් නිරන්තරයෙන් මේ පිළිබඳ විමසිල්ලෙන් පසුවේ. මල් කර්මාන්තයට අමතරව, ක්‍රිස්ටල් කර්මාන්තය තුං හයි කෝරළයේ සංකේතයක් වශයෙන් සැලකෙයි. ලෝකයේ ක්‍රිස්ටල් නගරය යන නමින් හැඳින්වෙන එම කෝරළයේ පළිඟු නිපදවන ව්‍යවසායකයින් සංඛ්‍යාව 3000 ඉක්මවා ඇත. චීනයේ ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය යන ප්‍රතිපත්තියේ නායකත්වය යටතේ තුං හයි රජය පළිඟු නිෂ්පාදිතයන්ට ලොව පුරා ගනුදෙනු කිරීමේ උපායමාර්ග සකස්කර දී තිබේ. එමඟින් තුං හයි පළිඟු වෙළෙඳාම බොහෝ රටවල සාර්ථකවී ඇත.
















# නිෂ්පාදන කර්මාන්ත වර්ධනයේදී අවධානයට ලක් කළ යුතු අවස්ථා කිහිපයක් හඳුනා ගනිමු



ඉදිරිපත් කිරීම : ලියු හුයි



ආර්ථික වශයෙන් චීනයේ දියුණුම පළාතක් වන ගුවන් තුං පළාත නිෂ්පාදන කර්මාන්තයෙන් වර්ධනය වන නගරයක් බව කිව හැකිය. කාර්මික නිර්මාණ, විශාල ප්‍රමාණයේ විද්‍යාත්මක යන්ත්‍රෝපකරණ, රොබෝවරුන් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය, තොරතුරු තාක්ෂණය ඇතුළු නව අධි විද්‍යා තාක්ෂණික ව්‍යාපාර දැනට ගුවන් තුං පළාතේ වර්ධනයේ එන්ජිම බවට පත් ව ඇත.

කර්මාන්ත ජාලයේ වැදගත් කොටසක් වශයෙන් කාර්මික නිර්මාණකරණය, නිර්මාණශීලිත්වය සතු සිතුවිලි ප්‍රායෝගික නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමේ වැදගත් ක්‍රමයක් ලෙස පෙන්වා දිය හැකිය. ඒ ක්ෂේත්‍රය පිළිබඳව කතා කරන විට, ගුවන් තුං පළාතේ 'කාර්මික නිර්මාණ නගරය' සඳහන් නොකරම බැරි ස්ථානයකි. පසුගිය දශකයක කාලය තුළ එහි ඉදි කර ඇති නව අධි තාක්ෂණික ව්‍යාපාර සංඛ්‍යාව 6 යේ සිට 238 දක්වා මෙන්ම නිර්මාණකරුවන්ගේ ගණන 50 හේ සිට 8000 දක්වා වැඩි වී තබේ. එහි සමස්ත නිෂ්පාදන වටිනාකම චීන යුවාන් කෝටියක සිට කෝටි 75ක් දක්වා වර්ධනය වී තිබේ.

ගුවන් තුං කාර්මික නිර්මාණ නගරයේ සේවය කරන ලියං චියැන්හාඕ පවසන පරිදි, කාර්මික නිර්මාණකරණය මගින් සුවිශාල අතිරේක වටිනාකමක් එක් කළ හැකිය. උදාහරණයක් වශයෙන්, දැනට තිබෙන නිෂ්පාදන වටිනාකම යුවාන් කෝටි 75කින් යුවාන් බිලියන 75ක වටිනාකමක් නිර්මාණය කිරීමට අපේක්ෂිතය. ඒ නිසා චීන රජය නිපැයුම් කර්මාන්තයට ඉමහත් වැදගත්කමක් ලබා දී ඇති බව ලියං චියැන්හාඕගේ අදහසකි.

කාර්මික නිර්මාණ නගරයකට නම් නිපැයුම් ධාරිතාව කේන්ද්‍රීය සාධකයක් ලෙස හැඳින්විය හැකිය. ප්‍රවීණයන් හඳුන්වා දීමේ වැදගත්කමත් පැහැදිලිය. එහි 'ශුන් ද' නිපැයුම් නිර්මාණ ආයතනය ගතහොත්, එහි සේවක මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් 130 දෙනෙකුගෙන් සියයට 80ක් පමණ පශ්චාත් හා ආචාර්ය උපාධිලාභීන්ය. නිර්මාණය, නිෂ්පාදනය, පර්යේෂණය, අධ්‍යයනය යන හැකියාව එම සංයෝගාත්මක ප්‍රවීණයන් තුළ දක්නට ලැබෙන වඩා වැදගත් සාධකයකි.













# කුඩා ධීවර ගම්මානයකින් ඇරඹි වත්මන් ශෙන් චෙන් හි සංවර්ධනය

දකුණු චීනයේ ගුවන් තුං පලාතේ පිහිටි ශෙන් චෙන් ප්‍රදේශය, පිටිසර කුඩා ගම්මානයක සිට කෝටි 2ක ජනගහණයකින් යුත් ප්‍රාණවත් ජාත්‍යන්තර නගරයක් බවට පරිවර්තනය වී තිබේ. මේ වසර චීනයේ ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය ක්‍රියාත්මක කිරීමේ 40වැනි සංවත්සර වසර ය. මේ විශේෂ කාලයේ එහි කුඩා ධීවර ගම්මානය පසුගිය දශක කිහිපය තුළ සිදු වූ විශාල විපර්යාසයෙන් ශෙන් චෙන්හි සංවර්ධන වේගය සංකේතවත් වෙයි.

එම ධීවර ගම්මානය ශෙන් චෙන් නගරයේ ලුවෝ හු දිස්ත්‍රික්කයේ පිහිටා තිබේ. පසුගිය ශතවර්ෂයේ තිස් ගණන්වල හා හතලිස් ගණන්වල සිට ගුවන් තුං පලාතේ තුං ගුඇන් ප්‍රදේශයේ ඇතැම් ධීවරයන් ශෙන් චෙන් ප්‍රදේශයට පැමිණ ධීවර කර්මාන්තයේ නිරත විය. නෞකා එම ධීවරයන්ගේ නිෂ්පාදන උපකරණක් මෙන්ම ඔවුන්ගේ නිවාස ය. ඒ කාලයේ ඔවුන්ගේ ජීවිතය ඉතා දුෂ්කර විය.

පසුගිය ශතවර්ෂයේ හැත්තෑ ගණන්වල අග භාගයේ චීන කොමියුනිස්ට් පක්ෂ ගුවන් තුං පලාත් කමිටුව චීන මධ්‍යම රජයට යෝජනාවක් ඉදිරිපත් කළේය. ශෙන් චෙන්, චූ හයි සහ ශැන් තෞ ප්‍රදේශවල අපනයන පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය කිරීමට චීන රජයෙන් විශේෂ අනුබල ලැබීමට පලාත් පක්ෂ කමිටුව බලාපොරොත්තු වන බව එම යෝජනාවේ සඳහන් විය.

එම යෝජනාව චීනයේ එවක නායක තෙං ශියඕ පිං මහතාගේ අනුබල ලබා ගත්තේය. 1980 වසරේ අගෝස්තු මාසයේ චීන ජාතික මහජන කොංග්‍රසයේ ස්ථාවර කමිටුව ශෙන් චෙන් විශේෂ ආර්ථික කලාපය ස්ථාපිත කිරීමට තීරණය කළේය.

ඉන් පසු ශෙන් චෙන්හි පිහිටි එම ධීවර ගම්මානයේ



ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං





මත්ස්‍ය අභිජනන කර්මාන්තය සංවර්ධනය කළේය. ශෙන් චෙන් විශේෂ ආර්ථික කලාපයේ නම්‍ය ප්‍රතිසංස්කරණ හා විවෘතභාව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ගම්මානයේ රථවාහන කණ්ඩායම් හා නෞකා ප්‍රවාහන කණ්ඩායම් සංවිධාන කෙරිණ. එමෙන්ම පිරිසැකසුම් කම්හල ආරම්භ විය. එම ගම්මානයේ යූ ෆෙං සීමා සහිත කොටස් සමාගම ස්ථාපිත කෙරිණ. එහි වැසියෝ මුදල් එක්රැස් කොට ගෙවල් දොරවල් ඉදි කළහ. පසුව චීනයේ සමස්ත ගම්මානවලින් එම ධීවර ගම්මානය පොහොසත්ම ගම්මානය බවට පත් විය.

වර්තමානයේ එම ධීවර ගම්මානයේ වැසියන් යූ ෆෙං සීමා සහිත කොටස් සමාගමේ කොටස් හිමිකරුවන් බවට පත් වී තිබේ. ඔවුන්ට වාර්ෂිකව එම සමාගමෙන් ප්‍රතිලාභ ලබා ගත හැකිය. නිවාස කුලි වැසියන්ගේ ප්‍රධාන ස්ථිර ආදායම් ද වෙයි.

එම ධීවර ගම්මානයේ වර්ධනය, ශෙන් චෙන් හි වසර 40ක් පුරා ප්‍රතිසංස්කරණ හා විවෘතභාවය ක්‍රියාත්මක කිරීමෙන් ලද ජයග්‍රහණයේ සංකේතයකි. ගෙවී ගිය වසර 40 තුළ ශෙන් චෙන්හි ජනතාව උත්සාහ දරමින් දැවැන්ත නාගරික නවීකරණ සංවර්ධන ජයග්‍රහණයක් නිර්මාණය කොට තිබේ.








# චීන ගායක

# ලි චියෑන්

සංගීතය විශ්ව භාෂාවකි. ගීතයක් ඇසීමෙන් ගායකයෙකුගේ හැඟීම්, ආකල්ප හා අදහස් හොඳින් දැනගත හැකිය. මේ සටහන චීනයේ විශේෂ ගායකයෙක් පිළිබඳවයි. ඔහුගේ නිර්මාණ නිරන්තරයෙන් තරුණයින්ගේ සිත් ඇද ගන්නා සුළුය. ඔහුගේ නම ලි චියෑන් ය.

2001 වසරේ ලි චියෑන් හා ලු කන් ශියු එක්ව ෂුවි මු නියැන් හුආ නම් සංගීත කණ්ඩායම නිර්මාණය කර තිබේ. ඉන් ලි චියෑන් නිල වශයෙන් ගායකයෙක් ලෙස සංගීත ක්ෂේත්‍රයට ප්‍රවේශ විය. 2001 වසරේ සැප්තැම්බර් මාසයේ ඔවුන්ගේ සංගීත කණ්ඩායම ප්‍රථම ගීත ඇල්බම නිකුත් කළේය. “ඔබ සමග ජීවිතය ගත කිරීම” නම් එම ඇල්බම නිකුත් කළ විට සංගීත ක්ෂේත්‍රයේ බො හෝ දෙනෙක් ඔවුන්ව අගය කළේය. ඔක්තෝබර් මාසයේ ඒ ඇල්බමේ ප්‍රධාන ගීතය 2001 වසරේ තුන්වන කාර්තුවේ චීනයේ සංගීත වැඩසටහන් අතර පළමු ස්ථාන 10 ය අතරට එක්විය. නමුත් 2002 වසරේ මැයි මාසයේ ෂුවි මු නියැන් හුආ සංගීත කණ්ඩායම දෙවැනි ගීත ඇල්බම නිකුත් කිරීමෙන් පසු ලි චියෑන් කණ්ඩාමෙන් ඉවත්වීමට තීරණය කළේය.

2003 වසරේ සැප්තැම්බර් මාසයේ ලි චියෑන් සිය ප්‍රථම ගීත ඇල්බමයත්, 2005 වසරේ ඔහු සිය දෙවැනි ගීත ඇල්බමයත් නිකුත් කළේය. “ඔබ සඳහා පැමිණීම” නම් එම ගීත ඇල්බම හේතුවෙන් ලි චියෑන් 2006 වසරේදී 12 වන ගෝලීය චීන ගීත ශ්‍රේණිය ගත කිරීමේදී චීන මහ ගොඩබිමේ විශිෂ්ට ගීත නිර්මාණය කළ හැකි ගායකයා නම් සම්මානය දිනා ගත්තේය. ඉන් පසුව ලි චියෑන් චීනයේ විවිධ සංගීත සම්මාන පිරිනැමීමේ උත්සව වල සම්මාන රැසක් දිනා ගෙන තිබේ.





ඉදිරිපත් කිරීම : චෙන් ගුවැන් වන්

ඔහු නිර්මාණය කරන්නේ ඉතා සංවේදී මෙන්ම මිහිරි තාලයෙන් යුතු ගී පද සහිත ගීත. එම ගීත වලින් බොහෝ දෙනෙකුගේ සාමාන්‍ය ජීවිතයේ සැබෑ අත්දැකීම් නිරූපණය කෙරේ. ලි චියෑන්ගේ ගීතවල ගී පද කවි තරම් සුන්දර චිත්‍ර නිරූපණය කළ හැකි බව බොහෝ අයගේ අදහසවී තිබේ. එම ගී පද ඔහු දෛනික ජීවිතයේ ඇසු දුටු දේ අනුව නිර්මාණය කරන අතර ඔහු දකින සාමාන්‍ය ජීවිතයේ ඉතා සුළු සිදුවීම් වුවද ඔහුට හැඟීම්බරව රචනා කළ හැකිය. මෙම ගී පද හා සංගීතය මගින් පිළිබිඹු වන්නේ ජනතාවගේ පොදු හැඟීම්ය. ඊට අමතරව මේ වන විට ලි චියෑන් තීරකයෙකු ලෙස ඇතැම් සංගීත තරගාවලි සඳහා සහභාගී වේ. එම අවස්ථාවලදී ඔහු තරුණ ගායක ගායිකාවන්ට උපදෙස් දෙමින් සිය සංගීත ක්ෂේත්‍රයේ අත්දැකීම් කියා දේ.

ලි චියෑන් අවංක ලෙස සංගීතයට ආදරය කරන අතර මිහිරි ගීත නිර්මාණය කිරීමට උත්සාහ කරමින් සිටී. සංගීතයට දක්වන උනන්දුව සහිත ලි චියෑන් අඛණ්ඩව චීන සංගීතයට දායක කරනු ඇති.











# සතුට ඇති තැන බොහෝ මිතුරන් හමු වේ...

门可罗雀





ඉදිරිපත් කිරීම : ලියු හුයි

චීනයේ බොහෝ ප්‍රස්ථා පිරුළු වලින් මානව සමාජයේ යම් යම් සංසිද්ධි උපහාසයට ලක් කර තිබේ. "මෙන් ක ලෝ චුයි" කියන ප්‍රස්ථා පිරුළ එබඳු එකකි. එය සිංහලට සරළව පෙරළුවොත්, "ද්වාරය ඉදිරියේ සිට උගුලකින් කුරුල්ලන් අල්ලා ගත හැකි ය" යන අදහස ඉන් කියැවේ. මෙහි අර්ථය අනුමාන කිරීමට හැකි ද?

ඉතිහාසයේ "චයි ගෝං" නම් අයෙක් සිටියේය. ඔහු "හ නන්" පළාතේ "කයි ෆෙං" නගරයේ ඉහළ නිලධාරියෙකු ලෙස කටයුතු කළේය. එවිට ඔහු සමග මිත්‍රවීමට ඔහුගේ නිවසට පැමිණි අය බොහෝය. සෑම දිනම මෙන් එවැනි තත්වයක් තිබිණ. ඒත් ටික දිනක් ගත වෙද්දී, "චයි ගෝං" යම් චෝදනාවක් මත ධූරයෙන් අස් කරනු ලැබිණ. ඒ සමගම ඔහුගේ නිවසට මිත්‍රයන්ගේ පැමිණීම එක්වරටම අඩු විය.



කළින් නිවසේ නිතරම වැඩි පිරිසක් සිටිය ද දැනට ද්වාරය ළඟ උගුලකින් කුරුල්ලන් අල්ලා ගත හැකි තරමට පිරිස අඩු විය.

කාලයකට පසුව "චයි ගෝං" යළිත් ඉහළ ධූරයකට පත් කරනු ලැබිණ. ඔහුගේ නිවස පෙර ලෙසම උණුසුම් වීමට පටන් ගත්තේය. මිත්‍රයන්ගේ පැමිණීම ද යළිත් නිරන්තරයෙන් සිදු විය.

මේ අත්දැකීම පිළිබඳව "චෙං ගෝං" ඉතා සංවේදී විය. යම් අයෙකුට තමාගේ සැබෑ මිත්‍රයන් හඳුනා ගත හැක්කේ තමා පොහොසත්කමෙන් දුප්පත් තත්ත්වයට පත් වීමෙන් පසුවය. එසේ නොවුණොත් තනතුරු තානාන්තර වලින්, සාමාන්‍ය වැසියෙකු බවට පත් වීමෙන් පසුව පමණක් බව, ඔහුට සිතුණි. පසුව මෙම කතාව ප්‍රස්ථා පිරුළක් ලෙසින් නිර්මාණය විය. "මෙන් ක ලෝ චුයි". "කළින් කොපමණ උණුසුම් වුවද, දැනට ද්වාරය ළඟ උගුලකින් කුරුල්ලන් අල්ලා ගත හැකි තරමට දොම්නස් වුණා" යන්න එහි අදහසය වේ.










# විස්මිත
# චීන මහා ප්‍රාකාරය

චීනයේ හොඳම සංචාරක සමය ලෙස සැලකෙන්නේ සීත සෘතුවෙන් පසුව එළඹෙන අප්‍රේල් හා මැයි මාසයයි. මන්ද එම මාසවල අධික සීතලක් හෝ අධික උණුසුමක් නොමැති සෞම්‍ය කාලගුණයක් පවතින නිසයි. එසේ ම එම කාලයේ පරිසරය ද හරිත පැහැගැන්වී මල් පිපී සුන්දරවත් වේ. මේ සුන්දරත්වය පිළිබඳ මා කියූ කරුණු අසා අප්‍රේල් මාසයේ අලුත් අවුරුදු නිවාඩුවට බිරිඳ සහ චූටි දුව චීනයට පැමිණියේ දහසක් බලාපොරොත්තු ඇතිවයි. ඒ අතර ඔවුන්ගේ ප්‍රධාන අපේක්ෂාවක් වූයේ ලොව පුදුම හතෙන් එකක් වන චීන මහා ප්‍රාකාරය නැරඹීමයි.

චීන මහා ප්‍රාකාරය කෙදිනක හෝ නැරඹීම මගේ ද කුඩා කළ සිට ම පැවති අපේක්ෂාවකි. චීනයට පැමිණි පසුව ඒ හා සම්බන්ධ බොහෝ කතාන්දර මම අපේ චූටි දුවට කියා දී ඇති නිසා චීනයට පැමිණෙන්නට පෙර ම ඇය ඒ පිළිබඳ බොහෝ දේවල් අසා ඇත. ඒ නිසාම ඇය හා බිරිඳ චීනයට පැමිණ දින දෙකකට පසුව ලොව පුදුම හතෙන් එකක් වගේම යුනෙස්කෝ සංවිධානය ලෝක උරුමයක් ලෙස නම් කළ චීන මහා ප්‍රාකාරය නැරඹීමට අපි ගියෙමු.

මිනිස් ශ්‍රමයෙන් පමණක් ගොඩනැගුණු ලොව දිගම ඉදිකිරීම චීන මහා ප්‍රාකාරයයි. එහි සමස්ත දිග කිලෝමීටර් 7500ට අධිකය. විවිධ යුගවල ඉදිවුණු මහා ප්‍රාකාරය තනි ප්‍රාකාරයක් නොවන අතර එය ප්‍රාකාර ගණනාවක එකතුවකි. මුලින්ම මෙය දැව හා මැටි වලින් ඉදිකර තිබේ. පසුව ගල් හා ගඩොල් භාවිත කර ඇත. චීන මහා ප්‍රාකාරය සඳහා යෙදෙන චීන නම් මගින් 'දිගු ප්‍රාකාරය' හෝ 'ලී දස දහසේ ප්‍රාකාරය' යන අර්ථය ගැබ් වේ. ප්‍රාකාරයේ පළල ම ප්‍රදේශය මීටර් 9ක් පමණ වන අතර උසින් වැඩිම ප්‍රදේශය මීටර් 8ක් පමණ වේ. 1987වසරේදී චීන මහා ප්‍රාකාරය යුනෙස්කෝ ලෝක උරුමයක් බවට පත්විය.

චීනයට අයත් ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම සඳහාත් සතුරු ආක්‍රමණ වැලැක්වීම සඳහාත් මෙම මහ පවුර ඉදිකළ බව පැවසේ. මීට අමතරව දේශසීමා පාලනය, සේද මාවතේ භාණ්ඩ ප්‍රවාහනය පහසු කිරීම සහ ආගමන හා විගමන කටයුතු මෙමගින් අපේක්ෂා කර ඇත. මෙය ඉදිකිරීමේදී විශාල වශයෙන් මිනිස් ශ්‍රමය යොදා ගෙන ඇත. ලක්ෂ තුනකට අධික සිරකරුවන්, ගැමියන් මෙන්ම අධිරාජ්‍යයන්ගේ දෝෂ දර්ශනයට ලක්වුවන් මෙහි ඉදිකිරීම් සඳහා යොදාගෙන තිබේ. ඔවුන් පමණක් නොව රටෙහි සමස්ත ජනතාව මහ පවුරේ ඉදිකිරීම් වෙනුවෙන් සිය කැපකිරීම් කරමින් ශක්තිය වැයකොට ඇත. මෙහි ඉදිකිරීම්වල නිරත

වු බහුතරය ප්‍රාකාරය මත්තේම ජීවිත කැප කළ බව පැවසේ. එහි ඇතැම් ස්ථාන ඛාදනය වීම හා කුණාටුවලට හසුවීම නිසා විනාශ වී ගොස් ඇත.

මෙම සියලු ඉතිහාසගත තොරතුරු මම බිරිඳ සහ චූටි දුව සමඟ බෙදා හදා ගත්තෙමි. ඇතැම් අවස්ථාවල අපි දෙදෙනාට ම පිළිතුරු දීමට අපහසු ප්‍රශ්න ද දුව පෙරලා අපෙන් ඇසුවෙමු. මහා ප්‍රාකාරය නගින්නට සූදානම් වනවාත් සමඟ ම ඒ හරහා මිනිත්තු 15ක පමණ කාලයක් තද සුළඟක් හමා ගියේ අපිට සීතල මුසු අමුතු පාරිසරික ආස්වාදයක් එක් කරමිනි. අපි මහා ප්‍රාකාරයට ගොඩ වූයේ වැඩිම සංචාරක ආකර්ෂණයට ලක්ව ඇති බෙයිජිං නගරයට ආසන්න බා ඩා ලිං ප්‍රාකාර කොටසෙනි. මෙය මිං රජ පෙළපත් සමයේ ඉදිකර ඇත. මේ කොටස සංචාරකයන් මෙන්ම චීනයට පැමිණෙන බොහෝ රාජ්‍ය නායකයින් හා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් බහුලව නරඹන කොටසයි.

සාමාන්‍යයෙන් දැනට දෛනිකව 20000ක පමණ සංචාරකයෝ චීන මහා ප්‍රාකාරයේ බා ඩා ලිං කොටස නරඹති. ප්‍රාකාරයේ ඇතැම් ස්ථානවල පඩිපෙළ ඇති අතර ඇතැම් ස්ථානවල පඩිපෙළ නොමැත. සමහර තැන්වල තියුණු නැග්මක් සහ තියුණු බැස්මක් ඇත.

සමතලා කොටස් වලදී මගේ අත අත්හරින චූටි දුව වේගයෙන් එහෙ මෙහෙ දුවයි. ඇගේ ඡායාරූපයක් කැමරා කාචයේ සටහන් කර ගැනීමට බො හෝ චීන වැසියන් උත්සාහ ගන්නේ අතීත චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය අපිට සිහිපත් කරමිනි. වෙහෙසකර ව්‍යායාමයක නිරත වන්නා සේ බිරිඳ ද හතිලමින් අමාරුවෙන් පවුර තරණය කරයි. ඇතැම් විටෙක ඇය ද මගේ අතේ එල්ලෙයි. ඒ අතරතුර පවුර තරණය කරන චීන වැසියන්ගේ ඉල්ලීම් මත ඡායාරූපවලට පෙනී සිටීමට ද අපි තිදෙනා අමතක කළේ නැහැ. ආදරයෙන් වෙලෙන යොවුන් වියේ පෙම්වතුන් ද විනෝදයෙන් මෙම පවුර තරණය කරන අයුරු මා සිහිපත් කළ යුතුය.

පූර්ණ චන්ද්‍රයාගෙන් ආලෝකවත් වු රාත්‍රියක චීන මහා ප්‍රාකාරයේ ගත කළ තොරතුරු සමඟින් ලබන කලාපයෙන් යළිත් හමු වෙමු.

සටහන: චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ උපදේශක සුගත් රත්නායක









ඉදිරිපත් කිරීම : වං යිං

# බිත්තර සහිත බැදපු තක්කාලි

## අවශ්‍ය ද්‍රව්‍ය

- තක්කාලි ග්‍රෑම් 300ක්
- බිත්තර 2ක්
- තෙල් අවශ්‍ය ප්‍රමාණයට
- ලීක්ස් ගහේ කොළ පැහැති කොටස් අවශ්‍ය ප්‍රමාණයට
- ලුණු අවශ්‍ය ප්‍රමාණයට
- සීනි අවශ්‍ය ප්‍රමාණයට





## සාදන ක්‍රමය

- තක්කාලි ලස්සණට කෑලි වලට කපන්න. පුළුවන් තරමට අර්ධ රවුම් හැඩයෙන් කැබලි වලට කපන්න.
- බිත්තර ගසාගෙන පොඩි භාජනයකට දමා හොඳින් මිශ්‍ර කරන්න.
- ලීක්ස් කුඩා කැබලි වලට කපා ගන්න.
- තෙල් සුදුසු ප්‍රමාණයට තාච්චියට දමා හොඳින් රත් වූ පසුව මිශ්‍ර කර ගත් බිත්තර එයට දමන්න. ඉන් පසු බැදගත් බිත්තර ඉවත් කරන්න.
- කපාගත් කුඩා ලීක්ස් ඉතුරු වූ තෙල්වලට දමා ගන්න.
- රත්වූ පසු දැනෙන සුවඳ අනුව කලින් කපා ගත් තක්කාලි කැබලි තාච්චියට දමන්න.
- සුළු වේලාවක් බැඳගත් පසු එයට සීනි හා ලුණු දමන්න. ඉන් පසුව කලින් බැදගත් බිත්තර ආපසු තාච්චියට දමන්න.
- ඊට සුළු වෙලාවකට පසු තාච්චිය බා ගන්න පුළුවන්.

ඔබට මතක් කළ යුතු දෙයක් තිබේ. මේ ව්‍යංජනය සාදන විට වැඩි වෙලාවක් බඳින්න අවශ්‍ය නෑ. සුළු වේලාවක් පමණක් බැඳගන්න. ඒ නිසා තක්කාලි වල අඩංගු පෝෂණ වලින් වැඩි ප්‍රමාණයක් ආරක්ෂා කරගත හැකියි.

## 坐飞机 - ගුවන් ගමනකදී

### 今日关键 අද පාඩමෙන් අවධානය

我想订去西安的往返机票。
වො ෂයන්ග් දින්ග් චූ ෂී අන් ද වන්ග් ෆන්ග් චී පියාඕ.
මට අවශ්‍යයි ඇණවුම් කරන්න ෂී අන් වලට යන එන ගුවන් ප්‍රවේශ පත්‍රයක්.

有打折的票吗？
යො ද ච ද පියාඕ මා?
වට්ටම් සහිත ප්‍රවේශ පත්‍රයක් තිබෙනවා ද?

行李托运吗？
ෂිං ලි තුවෝ යුන් මා?
ගමන් මලු ප්‍රවාහණය සඳහා භාර දෙනවා ද?

我想要一个靠窗的座位。
වො ෂියන් යාඕ යි ග කාඕ චුවන්ග් ද සුඕවෙයි.
මට අවශ්‍යයි කවුළුව අසල ඇති ආසනයක්.

我找不到行李了。
වො චාඕ බු දාඕ ෂින්ග් ලි ල.
මට සොයා ගන්න බෑ ගමන් මල්ල.

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话 一 පළමු සංවාදය

A: 我想订去西安的往返机票。
වො ෂයන්ග් දින්ග් චූ ෂී අන් ද වන්ග් ෆන්ග් චී පියාඕ.
මට අවශ්‍යයි ඇණවුම් කරන්න ෂී අන් වලට යන එන ගුවන් ප්‍රවේශ පත්‍රයක්.

B: 您想订哪天的？
නින් ෂියන්ග් දින්ග් නා තියන්ද?
කවරදාට ද ගුවන් ප්‍රවේශ පත්‍රය ඔබ ඇණවුම් කරන්න?

A: 14号的。ෂී ස් හාඕ ද.
14 වෙනිදා.

#### 对话二 දෙවන සංවාදය

A: 有打折的票吗？ යො ද ච ද පියාඕ මා?
වට්ටම් සහිත ප්‍රවේශ පත්‍රයක් තිබෙනවා ද?

B: 有。可以打八折。යො, කයි දා බා ච.
ඔව් තියෙනවා සීයයට අසූවකින් යුත් ප්‍රවේශ පත්‍ර.

#### 对话三 තෙවන සංවාදය

A: 行李托运吗？ ෂිං ලි තුවෝ යුන් මා?
ගමන් මලු ප්‍රවාහණය සඳහා භාර දෙනවා ද?

B: 不用托运。
බු යොන්ග් තු යුන්.
භාර දෙන්න එපා.

#### 对话四 සිව්වන සංවාදය

A: 我想要一个靠窗的座位。
වො ෂියන් යාඕ යි ග කාඕ චුවන්ග් ද සුඕවෙයි.
මට අවශ්‍යයි කවුළුව අසල ඇති ආසනයක්.

B: 可以。කයි.
පුළුවන්.

#### 对话五 පස්වන සංවාදය

A: 我找不到行李了。
වො චාඕ බු දාඕ ෂින්ග් ලි ල.
මට සොයා ගන්න බෑ ගමන් මල්ල.

B: 您不要着急。我来帮您。
නින් බු යාඕ චාඕ ජී, වො ලයි බන්ග් නින්.
ඔබ කරබල වෙන්න එපා මම ඔබට උදව්වක් දෙන්නම්.

### චීන සංස්කෘතියෙන් බිඳක්

චීන ජනතාව දුරකථන ඇමතුමකට පිළිතුරු දෙන්නේ වෙයි නීහාඕ කියලා. එහි තේරුම ආයුබෝවන් එහෙම නැත්නම් හෙලෝ කියන අදහසම තමයි. හැබැයි බොහෝ විට අපිට ඇහෙනවා දුරකථන ඇමතුම ලබා ගන්න තැනැත්තා හෙලෝ කවුද කථා කරන්නේ? එහෙම නැත්නම් කාට ද කථා කරන්න ඕන? කියලා සෘජුවම විමසනවා. ඒ වගේම තමයි දුරකථන ඇමතුම ලබා දෙන්නාත් මුළින්ම ඔහුව හෝ ඇයව හඳුන්වා දෙමිනුයි කථාව අරඹන්නේ. සමහර විටෙක ලංකාවේත් භාවිතා වෙන්නේ මේ ආකාරයේ යෙදුම්. හැබැයි බටහිරේදී නම් මේ යෙදුම් වෙනස්. ඇමතුම ලබන්නාම තමුන්ගේ නම සමහර විට තමුන්ගේ දුරකථන අංකය පවා ඇමතුමට පිළිතුරු දෙනවිටම පවසනවා. චීනයේ දී සාමාන්‍යයෙන් එකට කියන්නේ යී කියලා නේ. නමුත් අංකය දුරකථනයෙන් සඳහන් කරන විට යාඕ කියලා කියන්න චීන ජනතාව පුරුදු වෙලා තියෙනවා. ඒකට හේතුව සමාන ශබ්ද සහිත යෙදුම් භාවිතයෙන් සිදුවිය හැකි වැරදි අවබෝධය වළක්වා ගැනීම සඳහායි.





## 开车旅行 - මෝටර් රථයෙන් ගමන් කිරීමේදී

ඉදිරිපත් කිරීම:
සුන් පියෑන් වාඕ



### 今日关键 අද පාඩමෙන් අවධානය

我们去旅行吧。
වෝ මන් චූ ලියු ෂින්ග් බා.
අපි යමු සංචාරය කරන්න.

周末有什么计划？
චෞ මො යො ශෙන් ම චි හුවා?
සති අන්තයේ මොනවා ද තියෙන සැලසුම්?

咱们什么时候出发？
සා මන් ශෙන් ම ෂ හඕ චු ෆා?
අපි කොයි වෙලාවට ද පිටත් වෙන්නේ?

下一个景点还有多远？
ෂියා යි ග ජින් දියාන් හයි යො දෝ යුවාන්?
ඊළඟ දර්ශනීය ස්ථානයට තව කොපමණ දුර ද?

这儿的风景太美了。
චඅර් ද ෆන්ග් ජින් ඨයි මෙයි ල.
මෙහි දර්ශනය ඉතාම ලස්සනයි.

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话 一 පළමු සංවාදය

A: 最近天气真好。
සුයි ජින් තියන් චි චෙන් හාඕ.
මේ දවස්වල කාලගුණයත් හරිම හොඳයි.

B: 天气预报说明天晴天。
තියන් චි යු බාඕ ශෝ මින් තියන් චින්ග් තියන්.
කාලගුණ අනාවැකිය කියන්නේ හෙට හොඳ දවසක් කියලා.

A: 我们去旅行吧。
වෝ මන් චූ ලියු ෂින්ග් බා.
අපි යමු සංචාරය කරන්න.

B: 好啊。
හාඕ ආ.
හොඳයි.

#### 对话二 දෙවන සංවාදය

A: 周末有什么计划？
චෞ මො යො ශෙන් ම චි හුවා?
සති අන්තයේ මොනවා ද තියෙන සැලසුම්?

B: 我们想开车去长城玩玩。
වෝ මන් ෂයන්ග් කයි ච චූ චන්ග් චෙන්ග් වන් වන්.
අපි හිතාගෙන ඉන්නේ මෝටර් රථයෙන් මහා ප්‍රාකාරයට ගිහිං විනෝද වෙන්න කියලා.

#### 对话三 තෙවන සංවාදය

A: 咱们什么时候出发？
සා මන් ශෙන් ම ෂ හඕ චු ෆා?
අපි කොයි වෙලාවට ද පිටත් වෙන්නේ?

B: 星期六早上6点在大门口见面。
ෂින්ග් චී ලියු සාඕ ෂන්ග් ලියු දියන් සයි දා මන් කඕ චියන් මියන්.
සෙනසුරාදා උදේ හයට ප්‍රධාන දොරටුව ඉදිරියේදී හමු වෙමු.

#### 对话四 සිව්වන සංවාදය

A: 下一个景点还有多远？
ෂියා යි ග ජින් දියාන් හයි යො දෝ යුවාන්?
ඊළඟ දර්ශනීය ස්ථානයට තව කොපමණ දුර ද?

B: 我也不太清楚. 大概还有10公里。
වො යෙ බු තයි චින්ග් චු, දා ගයි හයි යො ෂ ගොන්ග් ලි.
මටත් පැහැදිලි නෑ, තව කිලෝමීටර් 10ක් පමණ.

#### 对话五 පස්වන සංවාදය

A: 这儿的风景太美了。
චඅර් ද ෆන්ග් ජින් ඨයි මෙයි ල.
මෙහි දර්ශනය ඉතාම ලස්සනයි.

B: 太漂亮了。
තයි පියාඕ ලියන් ල.
හරිම ලස්සනයි නේ.

### චීන සංස්කෘතියෙන් බිඳක්

2008 වසරේ සිට චීනයේ වාර්ෂික ජිතික නිවාඩු දින සංඛ්‍යාව 10 යේ සිට 11 දක්වා වැඩි කරනු ලැබුවා. ඒ අනුව අලුත් අවුරුදු දිනය, මැයි පළමු වැනි දින, ලෝක කම්කරු දිනය, චින්ග් මින්ග් උළෙල, මකර ඔරු උළෙල සහ සරත් සෘතු මැද දිනය සඳහා දිනක නිවාඩුව බැගින් හිමි වෙනවා. මීට අමතරව චීන වසන්ත උළෙල සහ ජාතික දින සැමරුම් සඳහා දින තුන බැගින් නිවාඩු ලැබෙනවා. සාමාන්‍ය සති අන්තයේ නිවාඩු දින දෙකක් සහිතව වසන්ත උළෙලට සහ ජාතික දින සැමරුමට චීන ජාතිකයන්ට සතියක පමණ නිවාඩුවක් ලැබෙනවා. ඒ නිසා නිවාඩු සමයේ සංචාරයේ යෙදීම මේ වන විට අතිශයින්ම ජනප්‍රිය වී තිබෙනවා. එපමණක් නෙවෙයි බොහෝ චීන ජාතිකයින් වර්තමානයේ සංචාරයේ යෙදෙන්නේ සිය පෞද්ගලික මෝටර් රථ වලිනුයි. කෙටි කාලීන කුලී පදනමින් මෝටර් රථ රැගෙන යාමට ලබා දෙන සමාගම් ඇති නිසා තමන්ගේම මෝටර් රථ නැති අය පවා එවැනි කුලී පදනමින් වාහන රැගෙන සංචාරයේ යෙදෙන ආකාරය වත්මන් චීනයේ දකින්න පුළුවන්. මෙවැනි සමාගම් දැන් ඉතා බහුලව ඇති නිසා මෝටර් රථයක් කුලී පදනමට ගැනීමේ ක්‍රියාපිළිවෙළ ද දැන් ඉතාමත් පහසු කර තිබෙනවා. ඔබට අන්තර්ජාලය ඔස්සේ පවා මෝටර් රථයක් කුලියට ගැනීමට පුළුවන්. ඒ වගේම ඇතැම් සංචාරකයින් පෙර දැනුම් දීම් මගින් කුලීයට ගන්නා මෝටර් රථය ගුවන් තොටුපළට හෝ දුම්රිය ස්ථානයට ගෙනවා ගන්නත් කටයුතු කරනවා. ඔවුන් එසේ කරන්නේ සිය සංචාරයට ඇති සීමිත කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්න.

# අසන්නන්ගේ බිත්ති පුවරුව




S.M. අනිතා
අංක 28,
හිඹුටාන
තෙල්වත්ත
(හිඹුටාන පාර)
ශ්‍රී ලංකාව
2018.01.17

චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සේවය,
චීනය

ගෞරවනීය සහෝදර, සහෝදරියනි

පළමු කොට මා චීන ජාත්‍යන්තර ගුවන් විදුලි සේවයේ [illegible] මගේ නම S.M. අනිතා [illegible] 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් වෙමි. [illegible] චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා [illegible] වෙමි.

නම:- S.M. අනිතා

ලිපිනය:- අංක 28,
හිඹුටාන
තෙල්වත්ත
(හිඹුටාන පාර)
ශ්‍රී ලංකාව

දුරකථන අංකය:- 0756819017

මීට,
මිට,
[illegible]
අනිතා

සඳිත්මා රන්සති
38/3/12 උඳුරුගොඩ
පොල්ගස්ඕවිට
10 320

ගෞරවනීය චීන ගුවන්විදුලියේ සිංහල සේවය වෙතයි

චීනය සහ ශ්‍රීලංකාව අතර පවතින සංස්කෘතික මිත්‍රත්වය පාලම චීන ජාත්‍යන්තර ගුවන්විදුලියේ සිංහල සේවයයි. [illegible] එමෙන්ම අප දෙරට අතර මිත්‍රත්වය [illegible] සිංහල සේවයට [illegible] කොට සලකමි. ලිපිය අවසන් කිරීමට පෙර [illegible] සිංහල බස [illegible] විදේශිකයෙක් [illegible]

සොඳුරු චීනයෙහි සංචාරක සිහිනය සිත් හි දරමින් [illegible] සුභ නව වසරක් පතමි!

මීට,
සඳිත්මා රන්සති

Sandithma Ransathi
No: 38/3/12
undurugoda,
polgasovita
10320
sri Lanka

## පැතුමක් පිවිතුරු



විලේ නිම්නයේ
සිසිඳු වෙහෙරේ
කොත් කැරැල්ලේ ගැටිලා
සිසිල් මදනල - ඇදෙයි හෙමිහිට
සුවඳ විනමල් සොය සොයා
බුදු සමිඳු ළඟ
සිතේ බැතියෙන්
මල් පහන් පූජා කලා
ඔබට ජය හා
සතුට සම්පත
ආසිරි පැතුමක් එක්කලා
අනන්ත සසර පුරා
එකම මගක හමු වී ඇත්
සෙවනැල්ලක් සේ
මා අසලම සිටින
ඔබටයි මේ
දයාබර පැතුම

[illegible] විසින්
චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සැම වෙත

ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං



# නාසයෙන් ලේ ගැලීමකදී ප්‍රථමාධාර

## 13 වන පාඩම



**නා**සයෙන් ලේ ගැලීම කලාතුරකින් අප අතර සිදු වන්නක් වුවත් නිතර නිතර සිදුවන්නේ නම් එය ඉමහත් අපහසුතා ඇතිකරවන්නකි. නාසයට තදබල පහරක් වැදීම, ඇද වැටීම හෝ හිස කිසිවක වැදීම හෝ පහර කෑම නිසා හිස් කබලට හා මුහුණට හානි වීම වැනි හදිසි අනතුරු නිසා මෙන්ම පීනස, අධි රුධිර පීඩනය වැනි රෝගී තත්ත්වයන් නිසා ද අධික වියළි කාලගුණය වැනි පාරිසරික හේතු නිසා ද නාසයෙන් ලේ ගැලීම සිදු වේ. ශරීර අභ්‍යන්තර ලේ ගැලීමක් විදහා දැක්වෙන මෙය ඉක්මනින් හඳුනා ගත හැකි හේතුවක් ඇතිව හෝ නැතුව ද සිදුවිය හැකිය. අනතුරු හෝ රෝගී අවස්ථාවකදී බොහෝ විට සිදුවන්නේ නාසය අභ්‍යන්තරයේ ඇති ඉතා සියුම් රුධිර කේශනාලිකාවලට හානි වී ස්වසන මාර්ගයට රුධිරය කාන්දු වීමයි.

**අරමුණ!**
**නාසයෙන් ලේ ගැලීමකදී ප්‍රථමාධාර කිරීමේ අරමුණු වන්නේ ලේ වහනය පාලනය කර ගැනීම හා ස්වසන මාර්ගය අවහිර වී අපහසුතා ඇතිවීම මගහරවා ගැනීමයි.**

මෙය වඩාත් භයානක වන්නේ රුධිර වහනය හේතුවෙන් රෝගියාට විශාල වශයෙන් රුධිරය අහිමිවීමකදීය. එමෙන්ම නාසයෙන් රුධිරය ගලන්නේ හිසට සිදු වූ අනතුරක් හේතුවෙන් නම් බොහෝ විට රුධිරය තුනී සහ වැඩි දියර ස්වභාවයකින් යුතු වේ. මෙවැනි තත්ත්වයක් වඩාත් භයානක වන්නේ හිස් කබලට හානි වී තිබිය හැකි වීමත්, මොළයට හානි වීමෙන් තරල පිටවීමත් සිදු විය හැකි නිසාය.

ඒ අනුව මෙවන් අවස්ථාවකදී කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව අප දැන් අවධානය යොමු කරමු.

### 1. රෝගියා වාඩි කොට ඉදිරියට නැවීමට සලස්වන්න

තුවාලකරුට ක්ලාන්තය, කම්පනය, සිහි නැතිවීම වැනි විවිධ රෝගී තත්ත්වයන් ඇතිවීමෙන් ඇද වැටීම වැළැක්වීම සඳහාත්, ගලන රුධිරය ආහාර මාර්ගයට හෝ ස්වසන මාර්ගයට ඇතුළුවීම වැළැක්වීම සඳහාත් මෙවන් අවස්ථාවක තැබිය යුතු සුදුසුම ස්ථාපිතය වන්නේ මෙම ඉරියව්වයි.

කුඩා ළමයකු නම් ඔබේ උකුලේ ළමයා හිඳුවාගෙන මෙම ඉරියව්වේ තබාගත හැකිය.





### 2. රෝගියාගේ නාසයේ අග මෘදු කොටස තෙරපා අල්වා ගැනීමට සලස්වන්න



රෝගියාගේම හෝ ඔබගේ එක් අතක මාපටඟිල්ල හා දඹරඟිල්ල භාවිතයෙන් නාසයේ අග මෘදු කොටස හොඳින් මිරිකා අල්ලාගෙන සිටින්න. **මේ අතරතුර කාලයේ රෝගියාට මුඛයෙන් හුස්ම ගන්නා ලෙස උපදෙස් දෙන්න**. මෙමගින් රුධිරය ගලන ස්ථානයට පීඩනයක් ලැබී රුධිර වහනය අඩු වනු ඇත. මෙම තෙරපුම විනාඩි 10 කින් ඉවත් කොට නාසය පරීක්ෂා කොට තවදුරටත් රුධිර වහනය සිදු වේනම්, නැවතත් එපරිදිම තෙරපුම යොදන්න.

නොනවත්වාම රුධිරය ගලයි නම්, නාසය අගට පීඩනය ලබා දෙමින්ම වහාම වෛද්‍යාධාර සඳහා යොමු කරන්න.



### 3. රෝගියා අස්වසන්න

තුවාලකරුගේ බිය දුරු කිරීම හා ආත්ම විශ්වාසය ගොඩනැගීම මගින් රුධිර සංසරණයෙහි සාමාන්‍ය තත්ත්වය ඇති කර ගැනීමට හැකියාව ඇත. එමගින් රුධිර වහනය පාලනය වීමට හා සාමාන්‍ය රුධිර සංසරණය පවත්වා ගැනීමට උදව්වක් ලැබේ.





### 4. නාසයට පහළින් භාජනයක් තබන්න. නැතිනම් පෑඩයක් තබා අල්වා ගැනීමට සලස්වන්න

නාසයෙන් ලේ ගැලීමේදී, ශරීරයෙන් ගිලිහුණු රුධිරය ප්‍රමාණය පිළිබඳව අදහසක් ලබා ගැනීමටත්, රෝගියාගේ සිරුර පුරා ලේ තැවරීම වැළැක්වීම සඳහාත් නාසය අගට ඉලක්ක වන පරිදි භාජනයක් තබන්න. නැතිනම් රෙදි කැබැල්ලක් තබා අල්ලා ගැනීමට රෝගියාට සහාය වන්න.

### 5. අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

- නාසය සීරීමෙන් හා ඇඟිලි ගැසීමෙන් වළකින ලෙස
- මුඛයට එන රුධිරය ඉවතට දමන ලෙස
- හිස පිටුපසට බර කිරීමෙන් වළකින ලෙස
- උඩුබැලි අතට නිදා ගැනීම හෝ ඇලවීමෙන් වළකින ලෙස
- වේදනා නාශක ලෙස ඇස්ප්‍රීන් නොගැනීමට

### 6. අවශ්‍ය පරිදි වෛද්‍යාධාර වෙත යොමු කරන්න.




**පහත සඳහන් අවස්ථාවලදී රෝගියා වෛද්‍යවරයෙකු වෙත යොමු කරන්න.**

- විනාඩි 30 ක් ඉක්මවා රුධිර වහනය වේ නම්
- රුධිර වහනය සිදු වූයේ අනතුරක් හේතුවෙන් නම්
- රෝගියාට දහඩිය දැමීම, නාඩි වේගය අක්‍රමවත් වීම, ඇඟ සුදුමැලි වීම හා සම සීතල වීම වැනි කම්පන රෝග ලක්ෂණ හෝ ස්වසන අපහසුතා ඇත්නම්
- උණ, ලේ වමනය හෝ මුහුණ ප්‍රදේශය ඉදිමීම වැනි රෝග ලක්ෂණ හා නිමිති තිබේනම්

**වැදගත්!**
**මෙවන් අවස්ථාවක රෝගියාට ආහාර පාන ලබා දීම නුසුදුසුය.**

ඉදිරි පාඩම්වලදී තවත් විවිධ සංකීර්ණ තුවාලවලින් රුධිර වහනය වීමකදී කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව සාකච්ඡා කරමු.

මෙම ප්‍රථමාධාර ක්‍රමශිල්ප එදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් ප්‍රථමාධාර ලබාදීමට ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රමශිල්ප පිළිබඳ විධිමත් ප්‍රථමාධාර පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.

# පසුගියදා ඇතිවුන ආපදා තත්වයේදී ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ මානුෂීය මෙහෙවර








ජාතික ආපදාවන් හිදී පෙරමුණ ගෙන කටයුතු කරන ශ්‍රී ලංකා රතු කුරුස සමාජය විසින් පසුගිය මැයි මස ඇතිවූ ගං වතුරින් ආපදාවට ලක් වූ ජනතාව උදෙසා කඩිනමින් මුල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දීමට කටයුතු කරනු ලැබීය. එහිදී රත්නපුර, පුත්තලම, කුරුණෑගල, නුවර, ගම්පහ, කොළඹ සහ කළුතර යන දිස්ත්‍රික්ක වල අවතැන් වූ ජනතාව සඳහා ප්‍රථමාධාර පහසුකම්, පානීය ජල බෝතල්, වියලි අහාර ද්‍රව්‍ය ලබාදීම ඇතුළුව විපතට පත්වූ ජනතාව ආරක්ෂිත ස්ථාන සඳහා යොමු කිරීම වැනි වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

තවද, හදිසි ආපදා තත්වය හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා එවැනි පවුල් 2800 ක් වෙනුවෙන් රු. 10,000/* බැගින් මුල්‍යමය ආධාරද ලබාදෙන ලදී.

මෙම ආධාර වැඩපිළිවෙල අන්තර් ජාතික රතුකුරුස සමාජය, චීන රතුකුරුස සමාජය සහ පෞද්ගලික ව්‍යාපාරික ආයතනයන්හි දායකත්වය මත සිදු කරන ලදී.












ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ කොළඹ ශාඛාවට පැමිණ Drone කැමරා මෙහෙයුම් නිරීක්ෂණය කරනා අයුරු

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ගරු සභාපති ජගත් අබේසිංහ මැතිතුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කර්නල් සුදත් මඩුගල්ල මහතා ද ජායරූපයේ සිටි.

# සුභාසර පාඨක සාමාජිකයෝ



සාමාජික අං : 101
**දින්සරි සහන්යා**
ලංකා සභා කණිෂ්ඨ විද්‍යාලය
බත්තරමුල්ල



සාමාජික අං : 102
**දුෂාන් ලක්ෂිත**
තර්ස්ටන් විද්‍යාලය
කොළඹ



සාමාජික අං : 103
**නේහාන් මධුසංක**
ආනන්ද ශාස්ත්‍රාලය
කෝට්ටේ



සාමාජික අං : 104
**පූර්ණ ජයවර්ධන**
කේරි විද්‍යාලය
කොළඹ



සාමාජික අං : 105
**රුවින්ද නිර්මාණ**
ආනන්ද ශාස්ත්‍රාලය
කෝට්ටේ



සාමාජික අං : 106
**සනුල සත්විරු**
සුදර්ශන ආදර්ශ විද්‍යාලය
මාකන්දන

---

## සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමානයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..................................................

ලිපිනය : ..................................................

වයස : .............................. පාසල : ..............................

දුරකථන : .............................. විද්‍යුත් ලිපිනය : ..............................

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ..................................................

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 7260/9490/7265/11900 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ට්න් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL

**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2374/0439
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka